4

# වාක්‍ය නිර්මාණය

"සැලේ ළා සෙමෙන් දලු බෝපත් "

ඉහත උද්ධෘතයෙහි දක්වා ඇත්තේ වචන එකතුවක් බව පෙනේ. එම වචන කියවූ විට නිශ්චිත අර්ථයක් වටහා ගැනීමට නොහැකි ය. එහෙත් එම වචන ම,

"ළා දලු බෝපත් සෙමෙන් සැලේ "

යනුවෙන් ලියූ විට අපට යම් අර්ථයක් වටහා ගත හැකි ය. එමෙන් ම එය ප්‍රකට බොදු ගීයක පද පේළියක් ද සිහියට කැඳවයි.

එක ම වචන එකතුවක් මුලින් ම පැවසූ ආකාරයෙන් නොවැටහීමටත් දෙවනු ව කී ආකාරයෙන් වැටහීමටත් හේතුව කුමක් ද? එයට හේතුව වචන පෙළගැස්මේ පිළිවෙළ යි. ඒ අනුව පිළිවෙළ වැරදුණු විට අර්ථය නොවැටහෙන නිසා, වචන යම් පිළිවෙළකට රටාවකට ගැළපීමෙන් අර්ථවත් වාක්‍යයක් නිර්මාණය වන බව අවබෝධ කර ගත හැකි යි.

වාක්‍ය නිර්මාණයේ දී මේ වචන ගැළපීම් රටාව, ව්‍යාකරණ නීති රීති වශයෙන් විධිමත් ව හැඳිනගත හැකි ය. පහත වැකි ඒ සඳහා නිදසුන් ය.

නංගී දුවයි
හිරු නැඟෙයි
බල්ලා බුරයි
සුළං හමයි

මෙම වැකිවල උක්තයක් (අවසාන ක්‍රියාවෙන් කියවෙන නාම පදය) සහ අවසාන ක්‍රියාවක් තිබේ. තිබෙන්නේ එපමණකි. එහෙත් අරුත හොඳින් පැහැදිලි ය. පෙර පාඩමේ දී උගත් පරිදි මේවා අකර්මක වාක්‍යය වේ. පහත වාක්‍ය දෙස බලන්න.

මම පන්සිල් ගනිමි
නුඹලා අකුරු ලියහු
දැරියෝ ගී ගයති



නොමිලේ බෙදාහැරීම පිණිස ය.

මෙම සරල වාක්‍ය තුනෙහි උක්ත නාම පදයට හා අවසාන ක්‍රියා පදයට අමතර ව තවත් නාම පදයක් තිබේ. එය කර්ම පදය වේ. උක්ත නාම පදයෙන් කර්ම පදයට යෙදෙන නාම පදය වෙන් කර හැඳින ගන්නේ අවසාන ක්‍රියා පදය දෙස බැලීමෙනි. අවසාන ක්‍රියා පදයෙන් කියවෙන පදය උක්ත වන අතර අවසාන ක්‍රියා පදයට යටත් වන අනෙක් නාම පද කර්ම පද වේ.

ඉහත පළමු වෙනි නිදසුන් වැකියේ උක්තය (මම) හා අවසාන ක්‍රියාව (ගනිමි) යන පද දෙක ම ඒක වචන හා උත්තම පුරුෂ වන බව පැහැදිලි වනු ඇත.

දෙවෙනි වාක්‍යයයේ උක්තය (නුඹලා) සහ අවසාන ක්‍රියාව (ලියහු) යන පද දෙක ම බහු වචන හා මධ්‍යම පුරුෂ වන බව පෙනේ.

තෙවෙනි වාක්‍යයේ ද උක්තය (දැරියෝ) සහ අවසාන ක්‍රියාව (ගයති) යන පද දෙක ම බහු වචන හා ප්‍රථම පුරුෂ වෙයි.

මේ අනුව උක්තයට අනුව අවසාන ක්‍රියාවත් අවසාන ක්‍රියාවට අනුව උක්තයත් තිබිය යුතු බව පෙනේ. මේ සම්බන්ධය මනා ව වටහා ගත් විට සරල වැකියක් තැනීමට ඔබට හැකියාව ලැබේ. ඒ ඔස්සේ කුඩා වාක්‍ය නිර්මාණය කර, ඒවා එකිනෙක සම්බන්ධ කර දිගු වැකි තැනීමටත් ඔබට ක්‍රමයෙන් උගත හැකි ය. වාක්‍ය නිර්මාණය හා අවබෝධය පිළිබඳ මේ වන විටත් ඔබට යම් කුසලතාවක් තිබේ. මේ පාඩම කියවා ඔබ තේරුම් ගන්නේ ද වාක්‍ය පිළිබඳ යම් දැනුමක් ඔබ සතු බැවිනි.

පහත වැකි දෙස ද අවධානය යොමු කරන්න.

මල් පිපෙයි.
සුනාමි ව්‍යසනයෙන් බොහෝ ගෙවල් විනාශ විය.
දුම්වැටි ටිකෙන් ටික මිනිසුන් මරා දමයි.
වැව් දිය මත මල් පෙති පාවේ.

මෙම වැකිවල උක්ත පදයෙහි ඒක වචන, බහු වචන භේදයක් නොසලකා අවසාන ක්‍රියා පදය ඒක වචනයෙන් ම යෙදී ඇත. අප්‍රාණවාචී හෙවත් අචේතනික නාම පද ඒක වචන වුව ද බහු වචන වුව ද අවසාන ක්‍රියා පදය පොදුවේ යෙදෙන්නේ ඒක වචනයෙන් ය.


# කුසලතා වර්ධනයට:

1 සුදුසු පද වරහන් තුළින් තෝරාගෙන පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i කුහුඹුවා වේගයෙන් ගමන් .......................... (කරති/කරයි)
ii කුරුල්ලෝ අහසේ පියාසර.......................... (කරති/කරයි)
iii .......................... දශක තුනකට පසු නාගදීපය වැඳීමට ගියහ. (ඔවුහු/ඔවුන්)
iv තෝ කුමක් .......................... (කළෙහි/කළෙහු)
v .......................... ගීතයකට සවන් දෙමු. (අපි/මම)
vi නුඹලා දහම් පාසල් .......................... (ගියෙහි/ගියෙහු)
vii නිළියෝ මනහර රැඟුමක් .......................... (පෙන්වයි/පෙන්වති)
viii .......................... දියෙහි පීනයි (කිඹුලා /කිඹුලෝ)
ix සරුංගලය වේගයෙන් ඉහළ .......................... (යයි /යති)
x .......................... මුහුදට ගලා බසී. (ගංගාවෝ/ගංගා)

2 පහත සඳහන් අර්ථය අපහැදිලි වාක්‍යවල පද මාරු කර අර්ථවත් වාක්‍ය තනන්න. ඔබේ අභ්‍යාස පොතේ මෙහි දක්වා ඇති රූපය අඳින්න. තනාගත් අර්ථවත් වැකි ඒ තුළ ලියන්න.

i කුඹුර ගොවියා කොටයි.
ii දෙසත් නාහිමියෝ දහම්
iii ද කරමු අපි කුමක් ?
iv කවයි මල්ලීට අම්මා බත්.
v නොබැඳේ පෙරළෙන පාසි ගලේ
vi පුදමි නෙළුම් මම මල්
vii රජවරු දෙති දන්
viii පැන යති පැන හාවෝ
ix ව්‍යසනය දකිමු පිටු දුම්කොළ
ix භූමියකි අභය පන්සල



3 (අ) එක් රූප රාමුවකට ගැළපෙන සරල වාක්‍ය තුන බැගින් ලියන්න.
(අ) රූප රාමු දෙකට ම අදාළ වන සරල වාක්‍ය දෙකක් ලියන්න.





4 පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

## අලි දළ උගුළන හැටි

හිවල් හාමි කෙළින් ම ගියේ ගොවි හාමි සමු වන්නට ය. එහෙත් කෙසේ සමු විය හැකි ද? ගොවි ගෙදරට යෑම නො සිතිය හැකි ය. ගොවි ගෙදර තිබියේ වා, ගොවි පළේ මායිමට ළං වීම ද සනීපයට හොඳ නො වේ. ඇයි? අර කරදර කාර බලු හාමි හැම තැන ම පෙනේ. හොඳ සුවඳක් ලද්දා සේ නාසය බිම ඔබා-ගෙන දුවන බලු හාමිට හිවල් හාමි අසලකට වත් පැමිණිය හොත් වහා දැනෙයි. ඉතින් ළඟට වත් එන්නේ කෙසේ ද?



*නොමිලේ බෙදාහැරීම පිණිස ය.*

හිවල් හාමි බොහෝ වේලා ඒ මේ අත ඇවිද්දේ ය. ඒ ඇවිද්දේ කොහි ද? ගොවි පළ කොහි ද? කුමක් කරන්නට ද? සනීපය රැක-ගන්නට නම් ගොවි පළට ළං විය යුතු ප්‍රමාණය හිවල් හාමි හොඳ හැටි දනී. දැන් ඇවිදින්නේ ගොවි පළට වදින්නට සුදුසු වේලාව බලමින් නො වේ, ගොවි හාමි කැලෑ පාරෙන් එයි දැ යි බලමිනුයි. හෝරාවෙක් ගියේ ය, දෙකෙක් ගියේ ය, තුනෙක් ගියේ ය. එහෙත් ගොවි හාමි නො එයි. හිවල් හාමි ගේ ඉවැසිලි දැන් කෙළවර ය. මේ ව්‍යාපාරය හරි නොයන ලෙස ය, දැන් පෙනෙනුයේ. එ හෙයින් හිවල් හාමි දිග සුසුමක් හෙළා පපුවට මඳ ඉවසිල්ලක් දෙන්නට උත්සාහ කොට, කරට උඩින් ගොවි පළ දෙස බලා, පෙර දැක පුරුදු ළා එළු පැටවුන් ගේ මසෙහි ඇති විය යුතු මෙළෙක් බව ගැන සලකා, දෙ තුන් විටක් ම තලු ගසා, ගෙදර යන සිත ඇති කළේ ය. බිම ඇන-ගෙන සිටි පසු භාගය මහත් උත්සහායෙන් සෙමෙන් සෙමෙන් එසැවී ය. හිස මඳක් සලා යළි දු ගොවි පළ දිසාවට ඇස් හැරැවී ය. ඉක්බිති සැබැවින් ම එක් සිත් සිතා-ගෙන වම් ඉදිරි පය පෙරට තිබී ය.

'තඩ්' යන මහ හඬෙක් වනය මැදින් නැගුණේ ය. හිවල් හාමි සතර පයින් ම රියනක් පමණ අහසට ගියේ ය. බිමට බට කල ඔහු ගේ දෙ කොන මාරු විය. හේ වෙන කිසිවක් නො සලකා ම, හිස් කොන හැරුණු අතට දුවන්නට ඉගිළුණේ ය. එහෙත් තමා කරන්නට පැමිණි ව්‍යාපාරය? එය හරි ගිය හොත් ලැබෙන එළු පැටවු? උන් ගේ මසේ මෙළෙක? අර ඇසුණු බිය කරු හඬ නිසා දෝ මේ සියල්ල බලාත්කාරයෙන් මෙන් හිවල් හාමි ගේ සිතට පෙරළී ආයේ ය. එ හෙයින් ගොවි පළ කවර දිශායෙහි දැ යි සොයන්නට හිස හැරැවූ ඔහුට බඩ අල්ලා-ගෙන හඬ නො නගා සිනා සෙන ගොවි හාමි පෙනුණේ ය.

*- හීන් සැරය*

(අ) 'ගොවි පළේ මායිමට ළං වීම ද සනීපයට හොඳ නො වේ' යන්නෙහි අදහස කුමක් ද?

(ආ) 'මේ ව්‍යාපාරය හරි නොයන ලෙස ය, දැන් පෙනෙනුයේ,' යන වාක්‍ය ඛණ්ඩයේ අදහස ලියා දක්වන්න.

(ඇ) 'ගෙදර යන සිත ඇති කළේ ය' යන වාක්‍යයේ අදහස වෙනස් නොවන පරිදි වෙනත් ආකාරයකට ලියා දක්වන්න.

(ඈ) 'හිවල් හාමි සතර පයින් ම රියනක් පමණ අහසට ගියේ ය.' යන වාක්‍යයේ අදහස ඔබේ වචනයෙන් ලියා එම අවස්ථාව සිතුවමට නඟන්න.

(ඉ) ගොවි හාමි බඩ අල්ලා-ගෙන හඬ නො නගා සිනා සෙනු දුටු හිවල් හාමිට ඇති වූ සිතිවිල්ල කුමක් ද යන පැනයට කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචනා කරන ලද 'හීන් සැරය' නමැති කෘතියේ 10 වන පරිච්ඡේදයේ පස් වැනි ඡේදය කියවා පිළිතුරු සොයන්න.